සැ. යු. -2009.01.23 දින පළ වූ අංක 1,586 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,587 - 2009 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2009.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 154 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 154 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 154 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 පෙබරවාරි මස 06 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ජනවාරි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන"**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

153 - B 079980—3,750 (2009/01)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 62

DRF/21/RECT/2725.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරි 2008 පෙබරවාරි මස 27 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවැනි ලුතිතන් අමරසිංහ ආරච්චිගේ උදය දිලිප් කුමාර ගරෙ (නි/66145)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

01-756

---

# ආණ්ඩුවේ නිවේදන

**සමිති ආඥා පනත**

සමිති ආඥා පනතේ (123 අධිකාරය ) 3 වැනි සහ 4 වැනි වගන්ති වලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍ය සුමිත්‍ර ආරච්චිගේ දොන් බන්දුල චන්ද්‍රසිරි ගුණවර්ධන වන මම මෙම නිවේදනයෙන්,

01. අංක 01, බෙතෙස්ඩා පෙදෙස, කොළඹ 05 දරන දරන ස්ථානයේ පිහිටි "ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් ප්‍රොෆෙෂනල් මැනේජර්ස්" නැමැති සමිතිය, සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි.

02. සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනතේ අදාළ කිරීම් එකී සමිතියට සීමා කරමි.

සුමිත්‍ර ආරච්චිගේ දොන් බන්දුල චන්ද්‍රසිරි ගුණවර්ධන,
වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර
හා පාරිභෝගික සේවා අමාත්‍ය.

2009 ජනවාරි මස 02 වැනි දින,
වෙළඳ අලෙවි සංවර්ධන, සමුපකාර හා
පාරිභෝගික සේවා අමාත්‍යාංශය
අංක 330, යුනියන් පෙදෙස,
කොළඹ 02.

01-723

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : කේඑස්/5/6006/එස්ඕ1/353

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.11.07 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් එස්.පී. අමරසිංහ විසින් සහතික කරන ලද 2003.12.12 දින හා අංක 3524 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, මාතලේ, පදිංචි අලකොලඅංගේ හංගිලිගෙදර උපාලි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.10.30 දිනට මුල් ණය මුදල හා එය මත පොලී වශයෙන් රුපියල් දෙලක්ෂ පන්දහස් තුන්සිය විසි නවයයි ශත තිහක (රු 2,05,329.30) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3524 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැත්තෑවයි ශත තිස්එක (රු. 70.31) බැගින් වැඩිපුර පොලී ද අය විය යුතුව ඇති බැවින් ද, (ඉහත දිනට පසු කරන ලද ගෙවීම් අඩු විය යුතුය.)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කටුගස්තොට, කහල්ල, අංක 26බී හා බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

**උපලේඛනය**

මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ වරකාමුර පිහිටි වරකන්දවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී.සංගක්කාර විසින් මැන සකසන ලද 1995.04.04 දින සහ අංක පී. පී. එම්. ඒ. 1147 දරන පිඹුරේ කැබලි අංක 92 දරන ප්‍රමාණයෙන් අක්කර 0, රූ. 0, පර්. දහතුනයි දශම අටයි තුන (අ. 0, රූ. 0, පර්. 13.83)ක් විශාල බිම් කොටස වේ.

මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් අංක බී 520/210 යටතේ ලියාපදිංචි වී ඇත.

තවද එකී පිඹුරේ මාර්ග සඳහා වෙන් කර ඇති කැබලි අංක 71 සහ 91 මතින් වැටී ඇති මාර්ග අයිතීන් ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03,

01-802/8

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 8113001035.
ණය ගිනුම් අංකය : 269730.

2008 සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2005 නොවැම්බර් මස 25 වැනි දින හා අංක 1487 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, බ්‍රාහ්මනගේ චමින්ද ප්‍රසාද් සහ පනාගොඩ ආචාරිගේ දෝන සුමාලි සෙව්වන්දි ණයකරුවන්/උකස්කරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකොලොස් ලක්ෂ පනස් නව දහස් හයසිය අසූහතරක (රු. 1,159,684) ක මුදලක් 2008 මැයි මස 27 වැනි දින විට කොමර්ෂල් බැන්ක ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් එකොලොස් ලක්ෂ පනස් නව දහස් හයසිය අසූහතරක (රු. 1,159,684) මුදලට 2008 මැයි මස 28 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,065,185ක මුදල මත 15%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 1487 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ප්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

#### උපලේඛනය

බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1998 ඔක්තෝබර් මස 05 වැනි දින සාදන ලද අංක 8904 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ දැඩිගමුව පිහිටි වෙල්පිල්ලැවෙකැලේ කියන ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියලු දේත් සමඟ බෙදා වෙන් කරන ලද ලොට් 8 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 12 සහ 11 ද, නැගෙනහිරට : ලොට් 11 ද, දකුණට : අංක 87, 48 දරන පිඹුරේ ලොට් 13 සහ 18 ද, බස්නාහිරට : ලොට් අංක 7 ද යන මායිම් තුළ අංක 8904 දරන පිඹුර පරිදි පර්චස් දොළහයි දශම හතරයි බිංදුවක් (අ. 0. රූ. 0. පර්. 12.40) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1163/227 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

පහත විස්තර කරන ලද පාරක් සඳහා වෙන් කරන ලද කොටස ඔස්සේ යැම් ඊම් කිරීමේ අයිතිය ද සමඟ වේ.

බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1998 ඔක්තෝබර් මස 05 වැනි දින සාදන ලද අංක 8904 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ දැඩිගමුව පිහිටි වෙල්පිල්ලැවෙකැලේ කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 11 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 5 ද, නැගෙනහිරට : ලොට් 1 සිට 4 ද, දකුණට : සිරිසුමන මාවත 1 වැනි පටුමග සහ ලොට් 8 ද, බස්නාහිරට : ලොට් 10, 9, 13 , 8 සහ 12 ද යන මායිම් තුළ අංක 8904 දරන පිඹුර පරිදි පර්චස් දොළහයි දශම හතයි බිංදුවක් (අ. 0. රූ. 0, පර්. 12.70) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1163/257 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

එකී අංක 8904 දරන පිඹුරේ පෙන්වා ඇති පාරවල් සඳහා වෙන්කොට ඇති (මීටර් 14ක් පළල) ලොට් 12හි සහ (මීටර් 3.5ක් පළල) ලොට් 13 හි ගමන් කිරීමේ අයිතිය ද සමඟ වේ.

ආර්. ආර්. දුණුවිල,
සමාගම් ලේකම්.

01-801

---

### සම්පත් බැංකුව පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල් සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 1014 5005 8115.

2007 ඔක්තෝබර් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙනියාය පන්සල පාරේ, අතලවිතානගේ ලාල් යන අය බන්ධනදායී වශයෙන් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාණ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ජූනි මස 26 දාතම හා අංක 571 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 අගෝස්තු මස 16 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පහලොස් ලක්ෂ හතලිස් දහස් නවසිය තිස්පහකුත් ශත පනස් නවයක් (රු. 1,540,935.59ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය

යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් පහලොස් ලක්ෂ හතලිස් දහස් නවසිය තිස්පහකුත් ශත පනස් නවයක් (රු. 1,540,935.59ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දාහතර ලක්ෂ පනස් දහස් දෙසීය පනස් හයකුත් ශත හැට තුනක (රු. 1,450,256.63ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් 2007 අගෝස්තු මස 17 වැනි දින සිට විකුණුම් දින තෙක් තව දුරටත් පොලි මුදල ද, සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 571 බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, මතුගොබේ පිහිටි "පරණකුඹුරුගොඩැල්ල" සහ "පරණකුඹුරුගොඩැල්ලහේන " නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් මැන සාදන ලද 2005 පෙබරවාරි මස 24 දාතම හා අංක 397 දරන පිඹුරේ ලොට් බී1 ලෙස ලකුණු කොට නිරූපිත කොටපොල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 77/253හි ලියාපදිංචි කර ඇති උතුරට : පල්ලේගම සිට දෙනියාය දක්වා දිවෙන ගම් සභා පාර ද, නැගෙනහිරට : ලොට් 23 (පාරට වෙන්කළ කොටස) ද, දකුණට : එම ඉඩමේම ලොට් බී2 ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් බී2 ද සහ අංක 1611 පිඹුරේ ලොට් ඒ ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිහතරක් (අ. 0, රූ. 0, පර්. 24) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාළ සියලු අයිතීන්, මාර්ග වරප්‍රසාද. සහන හා දාසත්වද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

01-818/2

---

### සම්පත් බැංකව පී. එල්. සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල් සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 1006 5023 9177.

2007 දෙසැම්බර් මස 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඳුල්ගොඩකන්ද, කටුපිටිය, කම්බියාඩිය පදිංචි ගෝනයාලගේ ගෙදර ශ්‍රීයානන්ද නොහොත් ගෝනයාලගේ ගෙදර මන්ජුල ශ්‍රීයානන්ද එදිරිසිංහ සහ රන්පටිපුර දේවගේ කාන්ති ජයතිස්ස යන දෙදෙනා බන්ධනදායී වශයෙන් සහ ඉහත කී ඉඳුල්ගොඩකන්ද කටුපිටිය, කම්බියාඩිය පදිංචි එකී ගෝනයාලගේ ගෙදර ශ්‍රීයානන්ද නොහොත් ගෝනයාලගේ ගෙදර මන්ජුල ශ්‍රීයානන්ද එදිරිසිංහ යන අය උකස්කරු වශයෙන් ද කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 ජූලි 19 දාතම හා අංක 227 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 අගෝස්තු මස 06 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ විසිහය දහසක (රු. 8,26,000) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ විසිහය දහසක (රු. 8,26,000) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හත්ලක්ෂ විසි අට දහසක (රු. 7,28,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහසය (16%) බැගින් 2007 අගෝස්තු මස 07 වැනි දින සිට එකී අංක 227 බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය පියවා නිම වන දින තෙක් තවදුරටත් පොලි මුදල ද, සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම එකී අංක 227 දරන උකස් බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ පත්තුවේ, ගල්බඩ කෝරළේ, එලුගල්ල ගමේ පිහිටි "කලඹටුවාවහේන " නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් විසින් සාදන ලද 2005 ජනවාරි මස 25 දාතම හා අංක 3126 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත උතුරට : කුපිවත්ත ද, නැගෙනහිරට : කලටුවාවහේන ද, දකුණට : නිවාසවල සිට ප්‍රධාන මාර්ගයට දිවෙන පාර ද සහ බටහිරට : කලටුවාවහේන ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම දෙකයි හයක් (අ. 0, රූ. 1, පර්. 23.26) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග

ඉහත කී ලොට් 1 පහත වඩාත් මැනැවින් විස්තර කොට ඇති ඉඩමේ ප්‍රති මිනුමකි.

ඉහත කී එලුගල්ල ගමේ පිහිටි "කලඹටුවාවහේන " නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් විසින් සාදන ලද අංක 1989 දෙසැම්බර් මස 16 දාතම හා අංක 5357/560 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට නිරූපිත කෑගල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව D 584/265හි ලියාපදිංචි කර ඇති උතුරට : කුපිවත්ත ද, නැගෙනහිරට : එම පිඹුරේම ලොට් 1 ද, දකුණට : දුම්රිය රක්ෂිතය ද සහ බටහිරට : ලොට් 3, 7 සහ 6 ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම දෙකක් (අ. 0,, රූ. 1, පර්. 23.2) වන සම්පූර්ණ ඉඩම එහි වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

01-818/3

**සම්පත් බැංකුව, පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0022 5000 6384.

2005 පෙබරවාරි මස 22 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙහිඕවිට, ඊරියගොල්ල, අංක 75හි (දෙදෙනාම) පදිංචි තුඩාව හේවා ගමගේ චන්ද්‍රදාස සහ තුඩාව හේවා ගමගේ සමන් චන්ද්‍රකුමාර ගමගේ යන අය බන්ධනදායීන් වශයෙන් සහ එකී දෙහිඕවිට, ඊරියගොල්ල, අංක 75හි තුඩාව හේවා ගමගේ චන්ද්‍රදාස යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2003 අප්‍රේල් මස 30 දාතම හා අංක 2192 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2003 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන්ලක්ෂ පනස් දහස් පන්සිය හතලිස් නවයයි ශත හතලිහක (රු. 5,50,549.40) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පන්ලක්ෂ පනස් දහස් පන්සිය හතලිස් නවයයි ශත හතලිහක (රු. 550,549.40) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් පන්ලක්ෂයක (රු. 5,00,000) මුදල සඳහා වසරකට සියයට විස්ස (20%) බැගින් 2004 ජනවාරි මස 01 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2192 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බටහිර අටවුගම් කෝරළේ, දෙහිඕවිට ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත දෙහිඕවිට (ඌරුපැලව්ව) පිහිටි දියහොඳ ඇලගාව කුඹුර (කොටස) නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. එම්. ගමගේ විසින් සාදන ලද 2000 සැප්තැම්බර් මස 26 දාතම හා අංක 1398 පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති, උතුරට : රාජසේකරට අයත් මාදෙයිරවල්ල වනාත ද, නැගෙනහිරට : දියහොඳ ඇල ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ද. බටහිරට : මහා මාර්ගය ද මායිම් වන අවිස්සාවේල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 117/14 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 1398 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 38.30) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සමග.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

01-818/4

**සම්පත් බැංකුව, පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0021 5002 1351.

2006 ජුනි මස 29 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුරාධපුර, මෛත්‍රීපාල සේනානායක මාවත, අංක 12හි පදිංචි දොන් කුලපති වසන්ත සුමිත්‍රාරච්චි සහ ගුරුතරගේ චම්පා එරංජනී පෙරේරා යන දෙදෙනා බන්ධනදායීන් වශයෙන් සහ ඉහත කී අනුරාධපුර, මෛත්‍රීපාල සේනානායක මාවත, අංක 12හි එකී ගුරුතරගේ චම්පා එරංජනී පෙරේරා යන අය උකස්කරු වශයෙන් ද අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 ජූලි මස 24 දාතම හා අංක 2241 සහ 2004 අප්‍රේල් 22 දාතම හා අංක 3230 දරන උකස් බැඳුම්කර දෙක මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2006 අප්‍රේල් මස 30 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන්ලක්ෂ හැටපන්දහස් හාරසිය විසි හතකුත් ශත අසූහයක් (රු. 5,65,427.86) එකී බැ=ඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් පන්ලක්ෂ හැටපන්දහස් හාරසිය විසිහතකුත් ශත විසිහයක (රු. 5,65,427.26) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හාරලක්ෂ අනූඑක් දහස් එකසිය අනූ හයක (රු. 491,196) මුදල සඳහා වසරකට සියයට දහඅට (18%) බැගින් 2006 මැයි මස 01 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2241 සහ 3230 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරගම් කෝරළේ, ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 318හි සාලිය මාවතේ, නුවරවැව ග්‍රාමයේ පිහිටි අනුරාධපුර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව L.D.O 36/212හි ලියාපදිංචි කොට ඇති, උතුරට : ලොට් අංක 607හි කොටසක් ද, නැගෙනහිරට : ලොට් අංක 614 ද, දකුණට : ලොට් අංක 614(1) හා 604A ද සහ බටහිරට : ලොට් අංක 605 ද මායිම් වූ ඉඩම් ප්‍රතිමිනුමකින් පසුව බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2000 ජූලි මස 21 දාතම හා අංක 3547 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : ලොට් 607හි කොටසක් ද, නැගෙනහිරට : ලොට් 614 ද, දකුණට : එකී ඉඩමේ ඉතිරි කොටස ද සහ බටහිරට : ලොට් 605 ද මායිම්වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 1, පර්. 20) වන ඉඩම් කොටස එහි ඇති ගොඩනැගිලි, වගාවන් සහ අනෙකුත් සියලුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

01-818/5

**සම්පත් බැංකුව, පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0035 5000 5467.

2008 ජනවාරි මස 31 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වංචාවල මැලැගොඩ සඳකැළුම් හි ගයාන් සගිත මුත්මුල්ල යන අය බන්ධනදායී වශයෙන් ඉහත කී වංචාවල, මැලැගොඩ සඳකැළුම් හි ඉහළවිතානගේ චමරි ප්‍රියංකා නොහොත් චමරි ප්‍රියංකා ඉහළවිතාන යන අය සමග මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කල 2006 සැප්තැම්බර් මස 22 දාතම හා අංක 703 දරන උකස් බැඳුම්කරය මත මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 සැප්තැම්බර් මස 30 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එක්ලක්ෂ අසූහතර දහස් නවසිය හැටහතරකුත් ශත තිස් අටක් (රු. 184,964.38ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් එක්ලක්ෂ අසූහතර දහස් නවසිය හැටහතරකුත් ශත තිස් අටක් (රු. 184,964.38ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් එක්ලක්ෂ අසූහතරදහස් හාරසිය පනස් හතකුත් ශත දාහත (රු. 148,457.17ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහසය (16%) බැගින් 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට එකී අංක 703 උකස් බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල පියවා නිමවන දින තෙක් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 703 බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ කලහේ ගමේ පිහිටි වෙරලුගහ වත්ත සහ ලාවුලුගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 06 දාතම හා අංක 1561 ඒ/2003 දරන පිඹුරේ ලොට් ඒ ලෙස ලකුණු කොට නිරූපිත ගාල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඩී 874/216හි ලියාපදිංචි කර ඇති එකී අංක 1561ඒ/2003 පිඹුරේ ප්‍රකාර උතුරට : ගාල්ල සිට අකුරණ දක්වා යන ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : මෙම ඉඩමෙන් බෙදූ ලොට් 7 සහ හිරිගල්කැටියවත්ත නොහොත් කජුගහවත්ත ද, දකුණට : අංක 290 පී දරන පිඹුරේ ලොට් 18 ද සහ බටහිරට : අංක 290පී පිඹුරේ ලොට් 21 සහ අංක 3852ඒ පිඹුරේ ලොට් බී ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිනවයයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 29.3) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාළ සියලු අයිතීන්, මාර්ග වරප්‍රසාද සහන හා දාසත්වද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

01-818/1

---

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2008.09.24 වැනි දින පවත්වන ලද රැසවීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් ඒ සී එන් ඔටෝ හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් සහ ලන්දේගෙදර ආනන්ද කුමාරසිරි හෙවත් ආනන්ද කුමාරසිරි ලන්දේගෙදර අධ්‍යක්ෂක සහ උකස්කරු වශයෙන් ද කලින් පෑන් එෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1781 සහ 2005 ඔක්තෝබර් මස 05 දිනැති සහ අංක 2385 සහ 2007 ජූලි මස 04 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

තවද ලන්දේගෙදර ආනන්ද කුමාරසිරි හෙවත් ආනන්ද කුමාරසිරි ලන්දේගෙදර සහ චමාලි දිල්හානි ගුණසේකර යන අය බන්ධනදායියන් වශයෙන් සහ ලන්දේගෙදර ආනන්ද කුමාරසිරි හෙවත් ආනන්ද කුමාරසිරි ලන්දේගෙදර යන අය උකස්කරු වශයෙන් ද, කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 2480 සහ 2007 ඔක්තෝබර් මස 09 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත :

(අ) පළමුව නම් සඳහන් ගණුදෙනුකරු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් මත 2008.03.31 වැනි දින දක්වා පොළිය සමගින් රුපියල් එක්ලක්ෂ දොළොස් දහස් හාරසියය විස්සයි ශත අසූතුනක (රු. 112,420.83) ක මුදල සහ එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් එක්ලක්ෂ දොලොස් දහස් හාරසියය විස්සයි ශත අසූ තුනක (රු. 112,420.83) මුදල මත 2008 අප්‍රේල් මස 01 වැනි දින සිට වර්ෂයකට 38% බැගින් පොළිය ද, සහ

(ආ) දෙවනුව නම් සඳහන් ගනුදෙනුකරු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් මත 2008.03.31 වැනි දින දක්වා පොළිය සමඟින් රුපියල් නම ලක්ෂ අනූ හයදහස් තුනයි ශත අනූ දෙක (රු. 996,003.92) ක මුදල සහ එකී උකස්කරයන් මත

ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක් රුපියල් නම ලක්ෂය (රු. 9,00,000) ක මුදල මත 2008 අප්‍රේල් මස 01 වැනි දින සිට වර්ෂයකට 29% බැගින් පොළිය ද,

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත් ;

එකී අංක 1781, 2385 සහ 2480 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් එක් මිලියන එක්ලක්ෂ අට දහස් හාරසියය විසි හතරයි ශත හැත්තෑ පහ (රු. 1,108,424.75) ක මුදල සහ ඉහත සඳහන් දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛණයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474 මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ආර්. එස්. එම්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල ලියාපදිංචි කොට්ඨාසයේ, උඩපළාත ගඟ පහළ කෝරළයේ ගම්පොල නගර සභා සීමාව තුළ රත්මල්කඩුව පාරේ පිහිටා ඇති (මීට පෙර බලයලත් මිනින්දෝරු එච්. ඩී. පී. රොඩ්රිගෝ විසින් මැන සාදන ලද අංක 3359 සහ 1960.06.02 දින දරන සැලැස්මේ දැක්වෙන) කලින් උඩ සිංහාපිටිය පාර) දැනට ආරාමය මාවත වරිපනම් අංක 6/16 දරන සිංහාපිටිය වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් මැන සාදන ලද අංක 3348 සහ 1994.10.21 වැනි දින දරන සැලැස්මට අනුව, උතුරට : සමරවීර ට හිමි වරිපනම් අංක 4/16 දරන පරිශ්‍රය වෙන් කරන එකී පිඹුරේ දැක්වෙන අංක 8 දරන කැබැල්ල, ඊසානදිගට : එකී පිඹුරේ දැක්වෙන වරිපනම් අංක 15/45 දරන පරිශ්‍රයේ ඉතිරි කොටස, දකුණට : වරිපනම් අංක 6/45 දරන පොල්වත්ත විහාරයට හිමි ඉඩම සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 6 දරන කැබැල්ල යන මායිම් තුළ පිහිටි එකිනෙකට යාබදව පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම එකයි හතර (අ. 0, රූ. 0, පර්. 15.14) ක් හෝ හෙක්ටයාර් 0.3830 ක් විශාල අංක 7 සහ ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම නමයයි අට (අ. 0, රූ. 0, පර්. 5.98) ක් හෝ හෙක්ටයාර් 0.01512ක් විශාල අංක 9 දරන ඉඩම් කැබලි දෙක ඒකාබද්ධව ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම එකයි දෙක (අ. 0, රූ. 0, පර්. 21.12)ක් සහ ආරාමය පාරේ වරිපනම් අංක 10/10 සහ දැනට 6/16 දරන මුලු දේපළ සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහ කොළ පළතුරු ආදී සියලු දේ සමග වේ.

බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් මැන සාදන ලද අංක 3348 සහ 1994.10.21 දරන සැලැස්මේ ලොට් අංක 8 දරන බිම් කැබැල්ල මත මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

01-822

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/44292/සීඩී7/572.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.07.14 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. සී. බී. ජෝෂප් විසින් සහතික කරන ලද 2002.09.27 වැනි දින හා අංක 1793 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, රණාල පදිංචි ජයසේකර ආරච්චිගේ වත්සලා සජීව ජයසේකර, ජයසේකර ආරච්චිගේ නිරංජලා සඳමාලි ජයසේකර සහ පතිරන්නැහැලාගේ සුවන්දිකා රාජපක්ෂ (ජීවිත බුක්තිකරු ) සහ ජයසේකර ආරච්චිගේ ගෝමස් අප්පුහාමි ජයසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.06.19 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හත්ලක්ෂ අනූතුන් දහස් තුන්සිය හැටහතරයි ශත අනූපහ (රු. 7,93,364.95) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1793 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හාරසිය තිස් හතරයි ශත හැත්තෑ දෙකක (රු. 434.72) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (ඉහත දිනට පසු කරන ලද ගෙවීම් අඩු විය යුතුය.)

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී.පී. එල්. සී. ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ රණාල ගමේ පිහිටි රපියෙල්ගෙ ඔවිට නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන් විසින් 2001.02.12 වැනි දින මැන සකසන ලද අංක 8723 දරන පිඹුරේ කැබලි අංක ඒ සහ බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 30.5 ක් වූ බෙදා වෙන් කරන කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03,

01-802/5

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : ජීපී/02/02509/ජී2/282.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.09.08 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. යූ. කේ. වනිගසේකර විසින් සහතික කරන ලද 2004.09.29 දින හා අංක 2880 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, පල්ලෙවෙල පදිංචි කලුඅග්ගලගේ දයාවතී, මොරකන්ද ගමගේ මද්දුමහාමි (ජීවිත බුක්තිකරු ) බුලත්සිංහගේ තිලක් ප්‍රේමසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.08.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ හත්දහස් දෙසිය හැත්තෑඅටයි ශත තිස්නමය (රු. 3,07,278.39) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2880 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය විසිඅටයි ශත විසිඅටක් (රු. 128.28) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (ඉහත දිනට පසු කරන ලද ගෙවීම් අඩු විය යුතුය.).

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර,නුගේගොඩ, පාගොඩ පාර, අංක 03 හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ මැද පත්තුවේ මීරිගම ප්‍රාදේශීය සභා සීමාවේ කැන්දලන්ද ගමේ පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් බෙදා වෙන් කර සකසන ලද 1997.09.28 වැනි දින හා අංක 753/1997 දරන පිඹුරේ දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 30.07 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

එකී අංක 753/1997 දරන පිඹුර ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ඊ. 502/64 යටතේ ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-802/6

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/28469/සීඩී6/204, එස්- 1/48875/ඒඕ1/67.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.10.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. එස්. ජයවර්ධන සහ පී. ඒ. සී. කේ. නියතපාල විසින් සහතික කරන ලද 1999.12.29 සහ 2005.10.27 දින හා අංක 2641 සහ 2848දරන උකස් බැඳුම්කර මත අය විය යුතු මුදල් ගෙවීම, පිළියන්දල පදිංචි ජයමාන්න මොහොට්ටාලලාගේ ලසන්ත හිරාන් ජයමාන්න නොහොත් ලසන්ත හිරාන් ජයමාන්න සහ තනුජා නිශාන්ති ජයමාන්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2007.09.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් අසූ හතරදහස් දෙසිය විසි හතයි ශත අසූහයක් සහ රුපියල් විසි ලක්ෂ අසූ තුන්දහස් තුන්සිය දහනවයයි ශත අසූහය (රු. 84,227.86, රු. 20,83,319.86) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2641 සහ 2848 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් හයයි ශත පහළොවක් සහ රුපියල් නවසිය විසිහතයි ශත පනහ (රු. 46.15) සහ රු. 927.50) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (ඉහත දිනට පසු කරන ලද ගෙවීම් අඩු විය යුතුය.).

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ නිවන්තිඩිය ගමේ පිහිටි ඊරියගහදෙනිය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 1994.01.30 දින මැන සකසන ලද අංක 854 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 දරන ප්‍රමාණයෙන් අ. 0,රූ. 0, ප. 08ක් වූ ඉඩම.

මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම් 2019/110 යටතේ ලියාපදිංචි වී ඇත.

තවද, අංක 854 දරන පිඹුරේ කැබලි අංක අයිකේ සහ අයිඩී මතින් වැටී ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03,

01-802/7

LE/RE/201.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 023001740.

ණයකරුගේ සම්පූර්ණ නම : මිහිඳුකුලසූරිය පටබැඳිගේ මනෝජ් ඇන්ටන් කුමාර ප්‍රනාන්දු.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. පී. පී. ආර්. ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 3372 හා 2006.03.09 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසිදහස් තුන්සිය හැටඑකයි ශත හැත්තෑවක් (රු. 2,20,361.70) මුදලක් වර්ෂ 2007.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූඅටදහස් හාරසිය හතළිස් නවයයි ශත පහළොවක (රු. 1,98,449.15) මුදල ද වර්ෂ 2007.07.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසි එක්දහස් නවසිය දොළහයි ශත පනස්පහක් (රු. 21,912.55)ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ විසිදහස් තුන්සිය හැටඑකයි ශත හැත්තෑවක් (රු. 2,20,361.70) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අනූඅටදහස් හාරසිය හතළිස් නවයයි ශත පහළොවක (රු. 1,98,449.15) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.50%බැගින් වන පොළියක් 2007.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ ඔක්තෝබර් මස 02 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරුකෝරළේ දූනගහපත්තුවේ, කදිරාන ග්‍රාමයෙහි පිහිටි උළුඅම්බලමවත්ත දැන් ගුරුගේ සන්ෆ්ලවර් ගාර්ඩන් නමින් හඳුන්වන ඉඩමට 2001.08.20 දින පී. ඩී. එන්. පීරිස් මානක තැන විසින් මැන සම්පාදිත අංක 1911 AA පිඹුර ප්‍රකාර ලොට් 8 ට මායිම, උතුරට :ලොට් 7 ද ; නැගෙනහිරට : ලොට් 24 (මාර්ග රක්ෂිතය ) ද; දකුණට: ලොට් 9 ද ; බටහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම පහයි බිංදුවක් (අක්. 00, රූ. 00, පර්. 13.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 972/186 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

01-803

---

**මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.19 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද අංක 7539 සහ 2007.10.12 වන දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම බටකඩ ආචාරිගේ ශ්‍රියානි පුෂ්පලතා ජයසුන්දර මහත්මිය විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 7539 දරන බැඳුම්කරය මත රුපියල් තිස් හතර ලක්ෂ හැට හය දහස් හයසිය හැටහයයි සත හැත්තෑ දෙකක (රු.34,66,666.72) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් තිස් හතර ලක්ෂ හැට හය දහස් හයසිය හැටහයයි ශත හැත්තෑ දෙකක (රු.34,66,666.72) එකී මුදල ද 2008.06.12 වන දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට විසි හය (26%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අය විය යුතු වෙනත් මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම් ) අඩු කිරීමෙන් පසු, අය කර ගැනීම සඳහා අංක 7539 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත නාගරික කොට්ඨාස අංක 30 (වනාතමුල්ල) දෙමටගොඩ පිහිටියා වූ ද, දොස්තර ඩී. ද සිල්වා මාවතේ වරිපනම් අංක 315 දරන

ඉඩමේ බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 3708 හා 1996 මාර්තු මස 07 දින දරන පිඹුරේ ලොට් A වශයෙන් ලකුණුකොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ අංක 317 දරන පරිශ්‍රය ද ; නැගෙනහිරට : දොස්තර ඩැනිස්ටර් සිල්වා මාවත ද; දකුණට : ශාන්ත මැතිව් විද්‍යාල පරිශ්‍රය ද ; බස්නාහිරට: ා ශාන්ත මැතිව් විද්‍යාල පරිශ්‍රය ද, මායිම් වන්නා වූ ද එකී අංක 3708 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම හයයි හයක් (අක්. 0, රූඩ්. 0, පර්. 1.66) හෙවත් වර්ග මීටර් 42.0 ක් විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

ඉහත දැක්වෙනුයේ පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි :

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 30 (වනාතමුල්ල) නාගරික කොට්ඨාසයේ දෙමටගොඩ පිහිටියා වූ ද, දැන් දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ වරිපනම් අංක 315 දරන ස්ථානයේ බලයලත් මිනින්දෝරු එස්. ටී. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1471 හා 1974 දෙසැම්බර් 15 දින දරන පිඹුරේ ලොට් අංක 18 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : එකී පිඹුරේ ලොට් අංක 17 ; නැගෙනහිරට : දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත ද; දකුණට : දොස්තර ඩී. ද සිල්වා මාවත සහ ශාන්ත මැතිව් විද්‍යාලය ද ; බස්නාහිරට : ශාන්ත මැතිව් විද්‍යාලය ද, මායිම් වන්නා වූ ද, එකී අංක 1471 දරන එකී පිඹුරට අනුව පර්චස් එකයි දශම අටයි හයක් (අ. 0, රූ, 0, පර්. 1.86) විශාල වූ ද කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A702/276 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි ආදිය ද වේ.

පහත දැක්වෙන මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත අංක 30 (වනාතමුල්ල) නාගරික කොට්ඨාසයේ, දෙමටගොඩ, දෙමටගොඩ පාරේ පිහිටියා වූ ද එකී අංක 1471 දරන පිඹුරේ ලොට් අංක 14 (පැසේජය හා මාර්ගය) ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තාවූ ද, උතුරට එකී අංක 1471 දරන පිඹුරේ ලොට් අංක 1 සිට 11 දක්වා වූ කොටස් සහ 33 දරන කොටස ද, නැගෙනහිරට : දොස්තර ඩැනිස්ටර් ද සිල්වා (බේස්ලයින් පාර) මාවත ද ; දකුණට : ශාන්ත මැතිව් විද්‍යාලය සහ පරිශ්‍රය ද; බස්නාහිරට : දෙමටගොඩ පාරේ වරිපනම් අංක 566 දරන පරිශ්‍රය ද මායිම් වන්නා වූ ද එකී අංක 1471 දරන පිඹුරට අනුව පර්චස් හයයි දශම එකයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.11) විශාල වූ ද කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A702/277 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 977/06, 07 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

01-785

## මහජන බැංකුව - හෝමාගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ ා

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය, විසින් සහතික කරන ලද 2007.03.15 දින අංක 2791 සහ 2007.03.15 දින සහතික කරන ලද අංක 2792 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම, නාඔටුන්න බඩල්ගේ වසන්ත මහතා, විසින් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කර මත රුපියල් දහසය ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් හතක (රු.16,33,333.37) මුදලක් සහ රුපියල් දාහතර ලක්ෂ හතලිස් දහස් හත්සිය අටයි ශත තිස් තුනක (රු. 14,40,708.33) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දහසය ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් හතක (රු. 16,33,333.37) එකී මුදල ද 2008 මාර්තු 16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එම මුදල මත, වර්ෂයකට සියයට විසි දෙක (22%) බැගින් තවදුරටත් වූ පොලිය ද රුපියල් දාහතර ලක්ෂ හතලිස් දහස් හත්සිය අටයි ශත තිස් තුනක (රු.14,40,708.33) මුදලක් සහ 2008.04.16 වැනි දින සිට ඒ මත වර්ෂයකට සියයට දහඅටයි දශම පහ (18.5%) බැගින් තවදුරටත් වූ පොලිය ද විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 2791 හා 2792 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු සමන්මලී රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම පිහිටියා වූ ද "හෙරලිගස් වත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් සාදන ලද අංක 1331 සහ 1998 මැයි 16 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූද, උතුරට : 56/ඒ/93 දරන පිඹුරේ ලොට් අංක 5 ද; නැගෙනහිරට : අංක 1179 දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් 2 ද ; දකුණට : අංක 56/ඒ/93 පිඹුරේ ලොට් අංක 7 සහ මෙම ඉඩමේ ලොට් අංක 2 සහ පාර ද ; බස්නාහිරට: අංක 56/ඒ/93 පිඹුරේ ලොට් අංක 6 හි ඉතිරි කොටස ද, මායිම්වන්නා වූ ද, එකී අංක 1331 දරන පිඹුරට අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල වූ බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත් ය.

පහත දැක්වෙන මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ :

බලයලත් මිනින්දෝරු ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් සාදන ලද අංක 1331 හා 1988 මැයි 16 දින දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස නිරූපණය කර ඇති පර්චස් දශම හතරයි හතක් (අ. 0, රූ, 0, පර්. 0.47) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 1473/36 හා 1711/185 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාප II.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

01-783

---

**මහජන බැංකුව- ඌරගස්මංහන්දිය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ:

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2006.06.30 දින ලියා සහතික කරන ලද අංක 744 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, හේවගේ අසංක යනප්‍රිය සමරසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් විසිඑක්ලක්ෂ හැටහතර දහස් පන්සිය හතලිහයි ශත විසිපහ (21,64,540.25) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.04.05 දින සිට වර්ෂයකට 16.5% බැගින් රුපියල් විසිඑක්ලක්ෂ හැටහතර දහස් පන්සිය හතලිහයි ශත විසිපහ (21,64,540.25) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසිඑක්ලක්ෂ හැටහතර දහස් පන්සිය හතලිහයි ශත විසිපහ (රු. 21,64,540.25) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 744 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කරන්දෙණිය දකුණ, මාගල ගමෙහි පිහිටි පරගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් 2006.04.06 යන දින මැන සාදන ලද අංක 2306 දරන පිඹුරේ නිරූපිත අංක 18125 දරන කැබැල්ලට මායිම්, උතුරට : ටී. පී. 222176 ද, නැගෙනහිරට : පාර ද (අඩි 14 ක් පළල පාර); දකුණට : ටී. පී. 222293 දරන කැබැල්ල ද ; බස්නාහිරට : ටී. පී. 3873 හි එම් 404 සහ එන් 404 දරන කැබැලි ද යන මෙකී සතර මායිම් තුළ පිහිටි රූඩ් 02, පර්චස් දහඅටක් (අක්. 0, රූඩ් 02, පර්චස් 18) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලුම දේ ද වේ. මෙම ඉඩම බලපිටිය ඉඩම් දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A249/170 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර, ගාල්ල.

01-786

---

**මහජන බැංකුව - දෙහිවල ගාලු පාර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.28 වන දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද අංක 160 සහ 2006.02.02 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම මොහමඩ් කාසිම් මොහමඩ් අලි මහතා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී බැඳුම්කරය මත රුපියල් දහසය ලක්ෂ දහ දහස් අටසිය අනූ එකයි සත හතක (රු.16,10,891.07) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දහසය ලක්ෂ දහ දහස් අටසිය අනූ එකයි සත හතක (රු.16,10,891.07) එකී මුදල ද, 2008.06.02 වන දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට දහසයයි දශම පහ (16.5%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අය කර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අය කර ගැනීම සඳහා අංක 160 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු සමන්මලී රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**දේපළ සහ පරිශ්‍රය පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව ඇතුළත රත්මලාන උතුර පිහිටියා වූද, “රත්මලාන එස්ටේට් ” යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද අංක 1354 හා 1993 ජූලි 21 දින දරන පිඹුරේ ලොට් “B1” ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : අංක 330 දරන පිඹුරේ ලොට් අංක 13 ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් “B2” දරන කොටස ද, දකුණට : එකී පිඹුරේ ලොට්

අංක 72 ද, බස්නාහිරට : අංක 330 දරන පිඹුරේ ලොට් අංක 19ද, මායිම්වන්නාවූ ද එකී අංක 1354 දරන පිඹුරට අනුව පර්චස් අටයි දශම හයයි දෙකක් (අක්. 0, රූ. 0, පර්. 8.62) ක් විශාල වූද ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1957/252 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි පන්සල පාරේ වරිපනම් අංක 104/1C දරන ගොඩනැගිල්ල ද වේ.

පහත දැක්වෙන ඉඩම උඩින් සහ දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය සහ වෙනත් අයිතීන් ද මීට ඇතුළත් වේ:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රිකක්යේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව ඇතුළත රත්මලාන උතුර පන්සල පාරේ පිහිටියා වූ ද, "රත්මලාන එස්ටේට් " යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද අංක 1354 හා 1993 ජූලි 21 දින දරන පිඹුරේ ලොට් B2 ලෙස ලකුණු කර ඇත්තා වූද, උතුරට : අංක 330 දරන පිඹුරේ ලොට් අංක 13 ද, නැගෙනහිරට : අංක 773 දරන පිඹුරේ ලොට් A දරන කොටස ද, දකුණට : අංක 330 දරන පිඹුරේ ලොට් අංක 72 දරන කොටස ද, බස්නාහිරට :අංක 1354 දරන පිඹුරේ ලොට් B1 දරන කොටස ද, මායිම් වන්නා වූ ද එකී අංක 1354 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම එකයි බින්දුවක් (1.10) විශාල වූද, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 1957/253 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූද වරිපනම් අංක 104/1C දරන ගොඩනැගිල්ල සහිත මුළු ඉඩම් කොටස.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M/2932/45, 46 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

01-784

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 327377.

2008 ජූලි මස 10 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

රාගම ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. සී. ඩී. එස්. එස්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද, 2001 අප්‍රේල් මස 27 වැනි දින හා අංක 6901 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, මහවත්තගේ දොන් ලාලිකා මාකරන්ද ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිපන්ලක්ෂ පනස්හත් දහස් නවසිය හතලිස් පහක (රු. 25,57.945) මුදලක් 2008 මැයි මස 15 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිපන්ලක්ෂ පනස්හත් දහස් නවසිය හතලිස් පහක (රු. 25,57,945) මුදලට 2008 මැයි මස 16 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 15,00,000ක මුදල මත 25%ක පොළිය ද සහ රු. 4,91,849ක මුදල මත 32%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 6901 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

#### උපලේඛනය

බලයලත් මානක කෘෂ් දාබරේ විසින් 1993 ජූනි මස 10 වැනි දින සහ 14 වැනි දින සාදන ලද අංක 6107/1993 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, නවම් මහර පිහිටි කපුගහකුඹුර ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 1ඒ දරන ඉඩමට මායිම්, උතුරට : ශ්‍රී ලංකා නාවික කඳවුරට අයිති කුරුඳුවත්ත ද ; නැගෙනහිරට : ලොට් 1බී ද ; දකුණට : පාර ද සහ බස්නාහිරට : කනත්ත සහ ශ්‍රී ලංකා නාවික කඳවුරට අයිති කුරුඳුවත්ත ද, යන මායිම් තුළ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් දාහතයි දශම දෙකයි පහක් (අ. 1, රූ. 1, පර්. 17.25) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 294/244 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

එකී අංක 6107/1993 දරන පිඹුරේ ලකුණු කරන ලද ලොට් 1ඒ දරන ඉඩම බලයලත් මානක එස්. ජී. ගුණතිලක විසින් 2001 අප්‍රේල් මස 17 වැනි දින මැනක දී නැවත බෙදීමක් කොට සාදන ලද අංක 1705 දරන පිඹුර පරිදි ඊට මායිම්, උතුරට: ශ්‍රී ලංකා නාවික කඳවුරට අයිති කුරුඳුවත්ත ද ; නැගෙනහිරට : අංක 6107/1993 දරන පිඹුරේ ලොට් 1බී සහ මෙම ඉඩම අතරින් ඇල පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම ද, දකුණට : නවම් මහර පාර ද සහ බස්නාහිරට : ශ්‍රී ලංකා නාවික කඳවුරට අයිති කුරුඳුවත්ත සහ මිනී කනත්ත ද, යන මායිම් තුළ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් දාහතයි දශම දෙකයි පහක් (අ. 1, රූ. 1, පර්. 17.25) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

01-793

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ඔක්තෝබර් මස 30

වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද අංක 752 සහ 2007 අගෝස්තු මස 02 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය නුගේගොඩ වනාත පාරේ අංක 38 දරන ස්ථානයේ පදිංචි අනුර විතානාරච්චි යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද, තවද ඉහත කී අනුර විතානාරච්චි ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් හැත්තෑලක්ෂ නවදහස් එකසියතිස්හයකුත් ශත හැත්තෑපහක මුදලක් (රුපියල් 70,09,136.75) සහ 2008.08.26 දිනට කාලීන ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වන රුපියල් හැටතුන්ලක්ෂයක මුදල (රුපියල් 63,00,000) මත සහ 2008.08.26 දිනට බැංකු අයිරා මත ගෙවීමට තිබෙන මුදල වන රුපියල් එක්දහස් හාරසියයක මුදල (රුපියල් 1,400) මත වැල් පොළී පදනම මත එකඟ වූ පරිදි 2008.08.27 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද මාසික විරාම සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ගංගොඩවිල පිහිටි වනාත පාරේ 2 වන පටුමගේ වරිපනම් අංක කලින් 5 ද, වර්තමානයේ දී 38 ද දරන මිල්ලගහවත්ත හෙවත් මහවත්ත සහ කැටකෙලගහවත්ත හෙවත් මහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 5302 සහ 1991 ඔක්තෝබර් මස 02 දින දරන පිඹුර ප්‍රකාර ලොට් බී වඩාත් නිවැරදිව සඳහන් කළහොත් ලොට් බී 1 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට: 2 වන පටුමග ද ; නැගෙනහිරට: වනාත පාර ද ; දකුණට : වනාත පාරේ වරිපනම් අංක 36 ද ; බස්නාහිරට: ලොට් ඒ ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 5302 දරන පිඹුර අනුව පර්චස් දාහතරයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 14.7) විශාල බිම් කැබැල්ලය. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1805/118 යටතේ ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

01-744/3

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 නොවැම්බර් මස 26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්.එම්.පී.පී. එන්. මහීපාල විසින් ලියා සහතික කරන ලද අංක 45 සහ 2005 දෙසැම්බර් මස 26 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය දෙහිවල එපිටහිල් වීදියේ, ඇල ඉවුර පාරේ අංක 134 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් නිලාම් මොහොමඩ් අබුසලාම් යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද, ඉහත කී මොහොමඩ් නිලාම් මොහොමඩ් අබුසලාම් ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

ඉහත කී රුපියල් පනස්තුන්ලක්ෂ විසිහයදහස් හයසිය තිස්හතරකුත් ශත අනූහතක මුදල (රුපියල් 53,26,634.97) සහ 2008.10.08 වන දිනට අයිරා මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් පනස්දෙලක්ෂ අනූනවදහස් නවසිය හැත්තෑහතරකුත් ශත අනූහතක මුදල (රුපියල් 52,99,974.97) මත එකඟ වූ පරිදි 2008.10.09 වන දින සිට විකිණීමේ දිනය තෙක් වැල්පොළී පදනම මත තවදුරටත් පොළිය ද මාසික විරාම සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියඩ් ඔක්ෂනියර්ස් හි එන්. ඩී. ඩී. පී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ මහනගර සභා සීමාව තුළ දකුණු වැල්ලවත්ත නාගරික කොට්ඨාස අංක 47හි පිහිටි වැල්ලවත්ත විවේකානන්ද පාරේ වරිපනම් අංක 30 6/6 දරන බලයලත් මිනින්දෝරු ජී. චන්ද්‍රසේන විසින් මැන සාදන ලද අංක 2001/153 සහ 2001.06.20 දින දරන සහාධිපත්‍යය පිඹුර ප්‍රකාර (6 වන මහලේ) 5944ඒ/F6/U6 වශයෙන් ලකුණු කරන ලද නේවාසික නිවාස ඒකකයට මායිම්, උතුරට : CEI දරන පොදු ප්‍රදේශයට ඉහළ විවෘත අවකාශයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තිය ද, නැගෙනහිරට : CEL දරන පොදු ප්‍රදේශයට ඉහළ විවෘත අවකාශයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තිය සහ මෙම ඒකකය සහ 5944ඒ/F6/U7 දරන ඒකකය වෙන් කරන බිත්තියේ මධ්‍යය ද ; දකුණට : CEI3 දරන පොදු ප්‍රදේශයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තිය ද ; බස්නාහිරට: 5944A/F6/U5 දරන ඒකකයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තියේ මධ්‍යය ද, ඉහළට : වහල ටෙරසයෙන් මෙම ඒකකය වෙන් කරන

කොන්ක්‍රීට් තට්ටුවේ මධ්‍යය ද පහළට 5944A/F5/U4 දරන ඒකකයෙන් මෙම ඒකකය වෙන් කරන කොන්ක්‍රීට් තට්ටුවේ මධ්‍යය ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2001/153 දරන සහාධිපත්‍යය පිඹුර අනුව වර්ග මීටර හැටහතරයි දශම අටයි තුනක (වර්ග මීටර 64.83) හෙවත් වර්ග අඩි හයසිය අනූහතයි දශම පහයි නවයක (වර්ග අඩි 697.59) විශාලත්වයෙන් යුක්ත ගෙබිමය.

මෙම 5944A/F6/U6 දරන ඒකකය නිදන කාමරයකින්, (වඩාත් නිවැරදිව කිවහොත් නිදන කාමර දෙකකින්) මුළුතැන්ගෙයකින්, පැන්ට්‍රියකින්, වැසිකිළි තුනකින් සහ ටෙරස දෙකකින් සමන්විතය.

තවද, සහාධිපත්‍යය දේපළේ පොදු ප්‍රදේශයෙන් මෙම 5944A/F6/U6 දරන ඒකකය සඳහා නොබෙදූ කොටස් අගය 2.125කි.

මෙම ඒකකය සඳහා ආසන්නතම පොදු ප්‍රවේශය CE 13 වේ.

මෙම ඒකකය වැල්ලවත්ත අංක 2 දරන ලියාපදිංචි පිඹුරේ ලොට් 5944හි A දරන ගොඩනැගිල්ලේ උපබෙදීමක ඒකකයකි.

මෙම 5944A/F6/U6 දරන ඒකකය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ CON.S.P. 13/156 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, අංක 45 දරන ඔප්පුවේ දෙවන උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති පොදු අවකාශයන් ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

01-744/2

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ඔක්තෝබර් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

"කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. සූරියආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 820 සහ 2006 ජූලි මස 13 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, සාංචිආරච්චි වත්ත ජාතික නිවාස යෝජනා ක්‍රමයේ අංක ජී3/6 දරන ස්ථානයේ පදිංචි දොඹෙකොටුවේ හන්ගිලිගෙදර දිලිප් කුමාර කුලරත්න යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උගස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242, දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද, ඉහත කී දොඹෙකොටුවෙ හන්ගිලිගෙදර දිලිප් කුමාර කුලරත්න ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් හත්ලක්ෂ විසිපන්දහස් පන්සිය එකොළහකුත් ශත තිස්එකක රුපියල් (රු. 7,25,511.31) මුදලක් සහ 2008.09.14 දිනට කාලීන ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් හයලක්ෂ හතළිස්තුන්දහසක මුදල (රුපියල් 6,43,000) මත එකඟ වූ පරිදි 2008.09.15 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොලිය ද මාසික විරාම සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ."

#### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාත ගඩලාදෙණිය ගමේ පිහිටි (වර්තමානයේ එක් දේපළක් වන) උඩහේනවත්ත, දන්කොටුව සහ දොඹේකොටුවේගෙදරවත්ත කොටසක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් මැන සාදන ලද අංක ජේ. 2363 සහ 2006 ජනවාරි මස 31 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 3 දරන බිම් කොටසට මායිම්: උතුරට : ශ්‍රී වික්‍රම සහ කීර්තිරත්න යන අයගේ උරුමක්කාරයන් අයිතිවාසිකම් කියන එම ඉඩමේ ම ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 4 (පාර) ද, බස්නාහිරට : ලොට් 2 සහ ඩී. එස්. අර්ලිස්හාමි විසින් අයිතිවාසිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක ජේ. 2363 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම හයයි හතක (අ. 0 රූ. 1 පර්. 23.67) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගොඩනැගිලි සහ සෑම සියළු දේත් සමගය. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 391/122 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

01-744/1

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට්

බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ඔක්තෝබර් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ:

" කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද අංක 804 සහ 2007 ඔක්තෝබර් මස 22 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය හංවැල්ල, ඉහළ හංවැල්ල, අංක 556/11 දරන ස්ථානයේ පදිංචි සුසන්ත සමරකෝන් මහවෙදගේ යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් ඔහු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද, තව ද, ඉහත කී සුසන්ත සමරකෝන් මහවෙදගේ ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් දහතුන්ලක්ෂ දහනවදහස් අටසියඅසූනවයකුත් ශත හැටඑකක මුදලක් (රුපියල් 13,19,889.61) සහ 2008.09.03 දිනට කාලීන ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වන රුපියල් එකොළොස්ලක්ෂ හතළිස්දහසක මුදල (රුපියල් 11,40,000) මත එකඟ වූ පරිදි 2008.09.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොලිය ද මාසික විරාම සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ "

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ ඉහළ හංවැල්ලේ පිහිටි දියපරගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සේන ඉද්දමල්ගොඩ විසින් මැන සාදන ලද අංක 5591 සහ 2007.10.08 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 3 දරන බිම් කොටසට මායිම් උතුරට : ඩී. ලියනවඩු විසින් අයිතිවාසිකම් කියන දියපොරගහලන්දේ වත්ත ද, නැගෙනහිරට : අංක 5591 දරන පිඹුරේ ලොට් 4 ද, දකුණට : ගම්සභා පාර ද, බස්නාහිරට : අංක 5591 දරන ඉහත කී පිඹුරේ ලොට් 2 ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 5591 දරන පිඹුර අනුව පර්චස් පහළොවක් (අ. 0. රූ. 0, පර්. 15) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොළ, පළතුරු සහ ගොඩනැගිලි ආදි සියළු දේත් සමගය. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 182/28 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

01-744/4

### මහජන බැංකුව - දික්වැල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ:

"මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රුබසිංහ විසින් සහතික කරන ලද 2004.12.03 දිනැති 1999 සහ 2007.07.09 දිනැති 4266 දරන උකස්කර ප්‍රකාර ගෙවීම් මරක්කල මානගේ මිල්ටන්, ජයවීර ලියන පටබැඳිගේ දර්ශනී සහ මරක්කල මානගේ සනි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 1999 සහ 4266 යටතේ රුපියල් හාරලක්ෂ අසූ දෙදහස් අටසිය විසිඑකයි ශත හතලිස් හතක (රු. 4,82,821.47) මුදලක් සහ රුපියල් නව ලක්ෂ අසූ අට දහස් එකසිය හැටහයයි ශත හැත්තෑවක (රු. 9,88,166.70) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.05.03 දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහ (18.25%) බැගින් රුපියල් හාරලක්ෂ අසූ දෙදහස් අටසිය විසි එකයි ශත හතලිස් හතක (රු. 4,82,821.47) මුදල සඳහා ද 2008.02.27 වැනි දින සිට වර්ෂයකට සියයට විසි හතර (24%) බැගින් රුපියල් නවලක්ෂ අසූ අට දහස් එකසිය හැට හයයි ශත හැත්තෑවක (රු. 9,88,166.70) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් හාරලක්ෂ අසූ දෙදහස් අටසිය විසි එකයි ශත හතලිස් හතක (රු. 4,82,821.47) මුදල සහ රුපියල් නවලක්ෂ අසූ අටහස් එකසිය හැට හයයි ශත හැත්තෑවක (රු. 9,88,166.70) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 1999 සහ 4266 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යකෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි"

### දේපළ පිළිබඳ විස්තරය

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම් පහල පිහිටි ගින්නලිගොඩ ආර දංගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක බී සහ සී දරන ඒකාබද්ධ කැබලි බෙදූ බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 967 සහ 1995.03.25 දිනැති දරන ප්ලෑන ප්‍රකාර ලොට් අංක 03 දරන බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් අංක 2 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක ඊ ද (දොඩම් පහල මහා විද්‍යාලීය භූමිය), දකුණට : මෙම ඉඩමේම ලොට් අංක 06 ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් අංක 11 (පාර) ද, මායිම් වන පර්චස් එකොලහයි දශම එකයි නවයක් (අ. 0 රූ. 0 පර්. 11.19) විශාල ඉඩම සහ ඒ තුළ තිබෙන වැව්ලි, ගොඩනැගිලි යනාදී සියළු දෑ ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ ලියාපදිංචි බී 559/260හි ලේඛනගතව ඇත.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම් පහල පිහිටි ගින්නලිගොඩ ආර, දංගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක බී සහ සී දරන ඒකාබද්ධ කැබලි බෙදූ බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 967 සහ 1995..03.25 දිනැති දරන ප්ලෑනේ ප්‍රකාර ලොට් අංක 06 දරන බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් අංක 3 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක ඊ ද (දොඩම් පහල මහා විද්‍යාලීය භූමිය), දකුණට : මෙම ඉඩමේම ලොට් අංක 07 ද, බස්නාහිරට

: මෙම ඉඩමේ ම ලොට් අංක 11 (පාර) ද, මායිම් වන පර්චස් එකොලහයි දශම තුනයි හතක් (අ. 0, රූ. 0, පර්. 11.37) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි යනාදී සියලු දැය ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ බී 559/261හි ලේඛනගතව ඇත.

3. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම් පහල පිහිටි ගින්නලිගොඩ ආර දංගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක බී සහ සී දරන ඒකාබද්ධ කැබලි බෙදූ බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 967 සහ 1995.03.25 දිනැති ප්ලෑන ප්‍රකාර ලොට් අංක 01 සහ 4 දරන ඒකාබද්ධ කැබලිවලට මායිම්, උතුරට : කරගහවත්ත ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක 02 සහ ලොට් අංක 11 දරන අඩි දොලහක් පළල පොදු පාර ද, දකුණට : මෙම ඉඩමේ ම ලොට් අංක 05 ද, බස්නාහිරට : ප්‍රධාන ඉඩමේ ලොට් ඒ ද, මායිම් වන පර්චස් විසි දෙකයි දශම හතරයි හතරක් (අ. 0 රූ. 0 පර්. 22.44) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි යනාදී සියලු දෑ ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 598/136හි ලේඛනගතව ඇත.

4. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම් පහල පිහිටි ගින්නලිගොඩ ආර දංගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක බී සහ සී දරන ඒකාබද්ධ කැබලි බෙදූ බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 967 සහ 1995.03.25 දිනැති ප්ලෑන ප්‍රකාර ලොට් අංක 05 දරන බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ම ලොට් අංක 4 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ම ලොට් අංක 11 දරන අඩි 12ක් පළල ප්‍රවේශ මාර්ගය ද, දකුණට : මෙම ඉඩමේ ම ලොට් අංක 08 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ම ලොට් අංක ඒ ද මායිම් වන පර්චස් එකොලහයි දශම බින්දුවයි හතක් (අ. 0 රූ. 0 පර්. 11.07) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි යනාදී සියලු දෑ ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 560/163හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ප්‍රදේශීය කළමණාකරු,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38 1/ඒ, පිට්ටනිය පාර,
මාතර.

01-787

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.